---

**මහියංගණ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 11 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 27 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මහියංගණ ප්‍රාදේශීය සභාවේ2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයෙ දෙසැම්බර් 31 දිනට රු.4,127,765 ක් වූ වියදම් ණයහිමියෝ රු.2,956,448 ක් ලෙස දැක්වීම නිසා ණයහිමියෝ රු.1,171,317 ක් අඩුවෙන් ද සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ඉටු නොකළ කර්මාන්ත 06 ක වටිනාකම වූ රු.2,997,728 ක් ණයගැතියන් යටතේ ගිණුම්ගත කිරීම නිසා 2012 දෙසැම්බර් 31 දිනට ණයගැතියෝ සහ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

2013 අප්‍රේල් 30 උන වන විට විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,998,024 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,493,937 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 1,573 | 1,455 | 3,718 |
| (ii) | බදු කුලී | 9,722 | 6,935 | 273 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,210 | 2,576 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,646 | 3,685 | 54 |

#### 2.2.2 වරිපනම් බදු

වර්ෂ 5 කට වරක් වරිපනම් බදු සංශෝධනයන් සිදුකර ඒ අනුව බදු අය කිරීමට කටයුතු නොකර 2012 වර්ෂය සඳහා ද 2001 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. රු.10,000 ට වඩා වැඩි වටිනාකමක් සහිත හිඟ වරිපනම් බදුගෙවන්නන් 39 දෙනෙකුගෙන් රු.1,229,181 ක මුදලක් සභාවට අයවිය යුතුව තිබුණි.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 3,449,374 |
| (ii) | මුද්දර ගාස්තු | 5,725,556 |

2.3 **නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

(අ) යුධ හමුදා ක්‍රියාන්විත රාජකාරි සඳහා ගෙන ගොස් තිබූ කැබ් රථයක් 2011 ඔක්තෝබර් 11 වැනි දින නැවත සභාව විසින් භාරගෙන ඇති අතර, එය සුදුසු පරිදි අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 12.5KVA ධාරිතාවයෙන් යුත් Mack Power විදුලි ජනක යන්ත්‍රයක් අක්‍රිය වීම නිසා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගෙන ගබඩා අංගනයේ තිබුණි.

2.4 **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 132(ඒ) හා (ඕ) වගන්ති වල විධිවිධාන අනුව අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන අවස්ථා 08 කදී ස්වේච්ජා ආයතන වෙත ද්‍රව්‍යාධාර ලබාදීමට රු.148,936 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

2.5 **අවිධිමත් ගනුදෙනු**

(අ) සභාවේ වැඩබලන නිලධාරියෙකුට අවසථා 6 කදී වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය ලෙස රු.34,470 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුවට සහභාගි වීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියේ ඌව පළාත් කාර්යාලයේ සැලසුම් සහකාරවරයාට සැලසුම් කමිටු දීමනාවට අමතරව ආයතන සංග්‍රහයේ XIV පරිච්ජේදයේ 2.2 වගන්තිය හා 8.1 වගන්තියට පටහැනිව අවස්ථා 2 කදී සැතපුම් කලිය හා සංයුක්ත දීමනා රු.12,440 ක් ගෙවා තිබුණි.

2.6 **කොන්ත්‍රාත් පරිපාලනය**

අළුත්වැඩියා වියදම රු.163,829 ක් වූ ගිරාඳුරුකෝට්ටේ උප කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් 2013 මාර්තු මස 21 දන භෞතික පරීක්ෂාවේ දී සවිකර තිබූ දොරවල්වල නිමාව ඉතා පහල මට්ටමක පැවතීම, ඉදිරිපස එක් උළුවස්සක බිත්තිය හා උළුවස්ස අතර මිලි මීටර් 8 ක පමණ පරතරයක් පැවතිම නියමිත පරිදි බිත්තියට සවිකර නොතිබීම, එනමල්

තීන්ත දෙවරක් ආලේප කිරීම වෙනුවට එක් වරක් පමණක් ආලේප කිරීම යන කරුණු නිරීක්ෂණය විය.

## 2.7 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සභාව විසින් පාලනය කරන නිවාඩු නිකේතනයේ සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.127,700 ක් වූ අතර, වියදම රු.928,036 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය තුළදී සභා අරමුදලට රු.800,336 ක මූල්‍ය පාඩුවක් සිදුව තිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබා ගිය සේවකයින් සිවු දෙනෙකුගෙන් 2012 දෙසැම්බර් 31 දිනට සභාවට අයවිය යුතු රු.65,894 ක් වූ සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය